# ශ්‍රී ලංකාවට උචිත අධ්‍යාපනයක් සඳහා ගාන්ධිගේ අධ්‍යාපන දර්ශනයේ මඟ පෙන්වීම

මහාචාර්ය ශාමින්ද වනසිංහ

## හැඳින්වීම

අධ්‍යාපනය යනු විභාග සමත්වීම හෝ සහතික ලබාගැනීම යන මානසිකත්වයෙන් බැහැරව සිතිය යුතු සංකල්පයක් වේ. වර්තමාන ශ්‍රී ලාංකිකයන් විභාගයට ලබාගන්නා ලකුණු හෝ ශ්‍රේණිය පදනම් කරගෙන ශිෂ්‍යයාගේ දක්ෂතා මැනීමට පෙලඹී සිටී. එහෙත් Max Wingo (1974) සඳහන් කර ඇති ආකාරයට අධ්‍යාපනය යනු ප්‍රායෝගික ක්‍රියාවලියක් වේ. ශිෂ්‍යයාගේ ආශාවන් හා අවශ්‍යතාවන් අනුව ප්‍රායෝගික අත්දැකීම් ලබාදීම මුලින් සිදුවිය යුතු බවත් න්‍යායාත්මකව කරුණු දෙවනුව ලබාදිය යුතු බවත් එහි සඳහන් වේ. ප්‍රායෝගික අත්දැකීම් ඇසුරින් අධ්‍යාපනය ලබාදීමේ වැදගත්කම Dale (1960) විසින් ද පෙන්වා දී තිබේ. එසේම අධ්‍යාපනය යනු අත්දැකීම් ප්‍රතිනිර්මාණය කිරීම බව Dewey (1916) විසින් ප්‍රකාශ කර ඇත. එහිදී තවදුරටත් දක්වා ඇත්තේ අධ්‍යාපනය නිරන්තරයෙන් ප්‍රතිසංවිධානය වන, ප්‍රතිනිර්මාණය වන, ප්‍රතිව්‍යූහගත වන ක්‍රියාවලියක් බවයි. ප්‍රායෝගිකව අධ්‍යාපනය ලබාදීමේ වැදගත්කම Roussean (1762) දී සිය එමිල් ග්‍රන්ථයෙන් ප්‍රකාශ කර ඇත. එහි සඳහන්ව ඇත්තේ ඔබට පුළුවන් සෑම අවස්ථාවකම ප්‍රායෝගිකව උගන්වන්න. ප්‍රායෝගිකව ඉගැන්වීමට නොහැකි අවස්ථාවන්හි පමණක් වචන උපකාරි කර ගන්න යනුවෙනි. මේ අනුව බලන විට සෑම දාර්ශනිකයකුගේම චින්තාව වන්නේ ශිෂ්‍යයන්ට ප්‍රායෝගික අත්දැකීම් මගින් අධ්‍යාපනය ලබාදිය යුතු බවයි. ශ්‍රී ලාංකීය අධ්‍යාපන ක්‍රමය පිරික්සීමේදී විදේශීය පාලන අවධියේ සිටම මේ දක්වාම ශාස්ත්‍රීය අධ්‍යාපනයක් මූලික කරගෙන ක්‍රියාත්මක වී ඇති බව දක්නට ලැබේ. ග්‍රාමීය අධ්‍යාපනය යෝජනා ක්‍රමය (හන්දෙස්ස ක්‍රමය) වැඩ හුරුව, ප්‍රාග්වෘත්තීය විෂය හඳුන්වා දීම වැනි අවස්ථා කීපයකදීම අධ්‍යාපනය ප්‍රායෝගික කිරීමට උත්සාහ ගත්ත ද ඒවා අසාර්ථක වූ

බව ඉතිහාසය පෙන්වා දෙයි. ඒ අනුව නූතන වැඩලෝකයට උචිත ශ්‍රමිකයකු නිෂ්පාදනය කිරීමට ශ්‍රී ලාංකීය අධ්‍යාපනය ක්‍රමය සඳහා ගාන්ධි ඉදිරිපත් කළ අධ්‍යාපන චින්තාවන් කෙසේ යොදාගත හැකි දැයි පරීක්ෂා කිරීම මෙම ලිපිය මගින් අපේක්ෂා කරනු ලැබේ.

**ගාන්ධි දර්ශනය අනුව අධ්‍යාපන අරමුණු**

ගාන්ධිගේ චින්තාවන් අනුව හිස, හද හා අත ඇතුළත් (3H) ත්‍රිවිධ අංශය සංවර්ධනය කිරීම අවශ්‍ය වන බව පැහැදිලි වේ. ඉන් මිනිසාගේ පූර්ණ සංවර්ධනයක් ඇති කිරීම මූලික අරමුණ වූ බව සඳහන් කළ හැකිය. ගාන්ධි (1937) ප්‍රකාශ කර ඇත්තේ අධ්‍යාපනයේ අරමුණු පුද්ගලයාගේ ශරීරය, මනස හා ආධ්‍යාත්මය යන ත්‍රිවිධ අංශයේම පූර්ණ වර්ධනයක් ඇති කිරීම බවය. මේ අනුව ගාන්ධිගේ අධ්‍යාපන අරමුණු සකස් වී ඇත්තේ

- අධ්‍යාපනය හස්ත කර්මාන්තය වටා ගොඩනැගීම
- ස්වයං පෝෂිත අධ්‍යාපනයක් වීම

යන මූලධර්ම දෙක මත බව සඳහන් කළ හැකිය. (Chaube, 1993) මෙම මූලධර්ම ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සඳහා ද භාවිත කිරීම මගින් වැඩලෝකයට සුදුසු පුද්ගලයන් බිහි කිරීමට හැකිවනු ඇත. මහත්මා ගාන්ධිගේ අධ්‍යාපනයේ අරමුණු පිළිබඳව විග්‍රහ කරන Bhatia (1993) ප්‍රධාන ක්ෂේත්‍ර 6ක් ගාන්ධිගේ අධ්‍යාපනය තුළ දැකිය හැකි බව දක්වයි. ඒවා නම් උපයෝගීතා අරමුණු, සංස්කෘතික අරමුණු, සමගිය වර්ධන අරමුණු, ජීවත්වීමේ අරමුණු චරිත වර්ධන අරමුණු හා සමාජමය අරමුණු වශයෙනි. මෙම අරමුණු ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සඳහා ද යොදා ගත හැකිය. ශිෂ්‍යයන්ට පාසල් අවධියේදීම තම අවශ්‍යතා ඉටු කර ගැනීමට හැකි ඉපයීම් මාර්ග උදා කරදීම උපයෝගිතා අරමුණු අනුව සම්පාදනය කර දිය හැකිය. විශේෂයෙන් 10-11, 12-13 ශ්‍රේණිවල ශිෂ්‍යයන්ට සතියකට පැය කීපයක් පාසල් වෙලාවෙන් පසු කර්මාන්ත ශාලාවක, ගොවිපලක වැඩ කර අත්දැකීම් ලබාගැනීමට සැලැස්වීමෙන් වැඩ අත්දැකීම් මෙන්ම ආදායමක් ලබා ගැනීමට ද හැකියාව ලබා ගත හැකිය. සමාජමය අරමුණු අනුව සමාජීය ගැටලු පිළිබඳ අවබෝධයක් ලබා ගැනීමට අවස්ථා ලබා දිය හැකිය. මේ ආකාරයට ශ්‍රී ලාංකික

විෂයමාලාව ද ගාන්ධි චින්තනය අනුව ප්‍රතිසංස්කරණය කළ හැකිය. අධ්‍යාපනය සඳහා බටහිර ආකෘතිවලට වඩා පෙරදිග ආකෘති ආදේශ කර ගැනීම මගින් දේශීය සංස්කෘතිය ද ආරක්‍ෂා කරගත හැකි බව සඳහන් කළ හැකිය.

**ගාන්ධි ඉදිරිපත් කළ අධ්‍යාපන සැලැස්ම**

ගාන්ධි ඉදිරිපත් කරන ලද අධ්‍යාපන සැලැස්ම අනුව ප්‍රධාන අවධි 4ක් දක්නට ලැබෙන බව කාරියවසම් (1998) පෙන්වා දී ඇත. එනම්,

1. පූර්ව මූලික අධ්‍යාපනය - අවු 7 අඩු ළමුන් සඳහා
2. මූලික අධ්‍යාපනය - අවු 7-14 ළමුන් සඳහා
3. පශ්චාත් මූලික අධ්‍යාපනය - අවු 14 වැඩි ළමුන් සඳහා
4. වැඩිහිටි අධ්‍යාපනය - වැඩිහිටියන් සඳහා

(කාරියවසම්, 1998: 104)

ඉහත සැලැස්මට අනුව අවු 7 දක්වා වූ පූර්ව මූලික අධ්‍යාපනය නිදහස් හා අනිවාර්ය විය. එසේම මෙම අවධියේදී අධ්‍යාපනය මව්බසින් ලබා දීමට කටයුතු කිරීම ද වැදගත් ලක්‍ෂණයක් විය. ගාන්ධි ඉදිරිපත් කළ අධ්‍යාපන ක්‍රමයේ වැදගත් ලක්‍ෂණයක් වූයේ හස්ත කර්මාන්ත පදනම් කරගෙන ක්‍රියාත්මක වීමය. එමගින් ජීවිත අත්දැකීම් ලබා ගැනීමට ශිෂ්‍යයන්ට අවස්ථාව ලැබීමත්, අධ්‍යාපනය ලබන අතර තුර ආදායම් ඉපයීමට යොමුවීමත් විශේෂයෙන් දක්නට ලැබිණි. එම නිසා දෙමාපියන්ට බරක් නොවී අධ්‍යාපනය ලබමින් අනාගත පුරවැසියන් ලෙස පුහුණු වීමට ද ඉන් අවස්ථාව හිමි විය.

ලංකාවේ ද මෙම ක්‍රමයට සමාන ක්‍රමවේදයක් 1943 දී C. W. W. කන්නන්ගර යෝජනා කරන ලද නමුදු ප්‍රායෝගිකව අධ්‍යාපනය ක්‍රියාත්මක විමේදී එය නැවතත් ශාස්ත්‍රීය අධ්‍යාපනයක් බවට ක්‍රමයෙන් පරිවර්තනය වී ඇත. කුඩා අවධියේ සිටම ශ්‍රී ලාංකීය සිසුන්ට ද ප්‍රායෝගික අත්දැකීම් ලබා ගැනීමට සැලැස්වීමත්, ඒ තුළින්

අධ්‍යාපනය ලබන අතරතුර ආදායමක් ලබා ගැනීමට සැලැස්වීමත් වැදගත් අංගයක් වේ. ශ්‍රී ලංකාව කෘෂිකාර්මික පසුබිමක් සහිත රටක් නිසා මෙසේ අත්දැකීම් ලබා ගැනීමට සැලැස්වීම ඉතා පහසු වේ. තමන් ජීවත්වන ප්‍රදේශයේ පවතින කෘෂිකාර්මික අංශයක් යටතේ මෙම ජීවිත අත්දැකීම් ලබා ගැනීමට සැලැස්විය හැකිය. 1972 අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ ප්‍රාග්වෘත්තිය විෂය මගින් ප්‍රායෝගික අත්දැකීම් ලබාදීමට උත්සාහ කළ ද එය ද වසර කිහිපයකින් නවතා දැමීමට සිදුවිය.

ක්‍රියාවෙන් ඉගෙනීම, ශ්‍රමාභිමානය ඇති කිරීම, ශිල්ප කේන්ද්‍රීය ඉගෙනීම, ජීවිතයට අදාළත්වයක් ඇති කිරීම වැනි ධනාත්මක ලක්‍ෂණ ගාන්ධි ඉදිරිපත් කළ අධ්‍යාපනය සැලැස්ම තුළ දැකගත හැකිය. ඒ අනුව ඉහත ලක්‍ෂණ ශ්‍රී ලාංකික අධ්‍යාපනය සඳහා ආදේශ කර ගැනීම වැදගත් වන බව කිව හැකිය.

ශ්‍රී ලාංකික දරුවන්ට ද පාසල් අධ්‍යාපනය ලබන අතරතුරද ජීවත් වීමට අදාළ ප්‍රායෝගික අත්දැකීම් ලබා ගනිමින් ශ්‍රමාභිමානය ඇති කිරීම සඳහා විවිධ ක්‍රියාකාරකම් 6 ශ්‍රේණියේ සිටම ලබාදිය හැකිය. යම් කිසි වෘත්තියක නිරත වී අත්දැකීම් ලබා ගැනීම සඳහා පාසල ආසන්නයේ ගොවිපලක, කර්මාන්ත ශාලාවක වැනි ආයතනයක පුහුණුව ලැබීමට යෙදවිය හැකිය. එය අනිවාර්ය විය යුතු අතර අදාළ ක්ෂේත්‍රයේ ප්‍රවීනයන් ලවා ප්‍රායෝගික අභ්‍යාස මගින් ඇගයීම කළ හැකිය.

**ගාන්ධි තුමා ඉදිරිපත් කළ විෂයමාලාවේ ස්වභාවය**

ගාන්ධි තුමාගේ අධ්‍යාපන දර්ශනයේ විෂයමාලාව හස්ත කර්මාන්ත පදනම් කරගෙන සකස් වී ඇති බව ඉහත අදහස් මගින් පැහැදිලි විය. ජීවත් වීමට අවශ්‍ය කුසලතා ලබාදීමේ අරමුණින් පාසල් විෂයමාලාව සකස් විය යුතු බව ගාන්ධි තුමාගේ අදහස වූ බව සේනාධීර හා වනසිංහ (2015) පෙන්වා දී ඇත. එහිදී කපු කැපීම ප්‍රධාන හස්ත කර්මාන්ත ලෙස අධ්‍යාපනය ක්‍රියාත්මක වූ අතර නාගරික ප්‍රදේශවල එම ප්‍රදේශවල දක්නට ලැබෙන ශිල්ප ක්‍රමයක් අදාළ කරගත හැකි බව ද ප්‍රකාශ කර ඇත. කෘෂිකාර්මික රටක් ලෙස ඉන්දියාව තම අධ්‍යාපනය කෘෂිකර්මය හා හස්ත කර්මාන්ත පිළිබඳ ප්‍රායෝගික

දැනුම ලබාදීම ප්‍රමුඛ විය යුතු බව Chaube (1993) විසින් ද සඳහන් කර ඇත. ගාන්ධි තුමා ඉදිරිපත් කළ විෂයමාලාවේ ප්‍රධාන විෂයන් 10ක් හා හස්ත කර්මාන්තයක් අන්තර්ගත වූ බව Dhiman (1987) විසින් දක්වා තිබේ. එම විෂයන් නම් මව්බස, සංස්කෘතිය, භාෂා (මේ යටතේ හින්දි, අරාබි, ඉංග්‍රීසි සංස්කෘත යන විෂයන්වලින් එකක් හැදෑරිය යුතුය) ඇඳීම, ශාරීරික අධ්‍යාපනය, මූලික ගණිතය, මූලික විද්‍යාව, සාහිත්‍ය, සංගීතය හා සමාජ අධ්‍යාපනය ආදිය ඇතුළත් විය.

ගාන්ධි තුමා අධ්‍යාපනය ලෙස විභාග සමත් වීම ප්‍රධාන කොට නොසැලකීය. හිස, හද, අත (3H) යන ත්‍රිවිධ අංශයම සංවර්ධනය විය යුතු බව ප්‍රකාශ කරන ලදී. ලංකාවේ වර්තමාන අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම විභාග කේන්ද්‍රීය වී තිබීම නිසා ශිෂ්‍යයාගේ කුසලතා හා ආකල්ප සංවර්ධනය පිළිබඳව ගැටලුවක් දක්නට ලැබේ. එමෙන්ම ජීවන ගමනේදී යම් කිසි වෘත්තියක් තෝරා ගැනීමට නොහැකි තත්ත්වයට ද වත්මන් සිසුන් පත්ව ඇත. අධ්‍යාපනය අවසන් කරන සිසුන් තුළ සමාජ කුසලතා ද ඉතා අවම මට්ටමක දක්නට ලැබේ. ගාන්ධි අධ්‍යාපනය අනුව යමින් හස්ත කර්මාන්ත වටා අධ්‍යාපනය කේන්ද්‍රගත කරමින් සමාජ කුසලතා හා ආකල්ප සංවර්ධනයට ද මූලික අධ්‍යාපනය යොමු විය යුතු කාලය පැමිණ ඇති බව ඒ අනුව සඳහන් කළ හැකිය. ඉංග්‍රීසි භාෂා සංවර්ධනය සඳහා ඉන්දියාව ගෙන ඇති ක්‍රියාමාර්ග අධ්‍යයනය කර, එය ශ්‍රී ලංකාවට ද ආදේශ කරගැනීම වැදගත්ය. අප සෑම විටම බටහිර ආකෘති සැලකිල්ලට ගනු ලැබුව ද පෙරදිග දාර්ශනිකයන් විශේෂයෙන් බුදුන් වහන්සේ, ගාන්ධි, ක්‍රිෂ්ණමූර්ති වැනි අයගේ දර්ශනයන් අනුව අධ්‍යාපනය හැඩගස්වා ගත හැකි නම් විපුල ප්‍රයෝජන ලබා ගත හැකි බව සඳහන් කළ හැකිය. නියම බුද්ධිමතුන් බිහි කළ හැක්කේ ඉන්ද්‍රිය පුහුණුව මගින් බව ද ගාන්ධි තුමා විශ්වාස කළේය. ලංකාවේ අධ්‍යාපනය සඳහා ද කායික හා ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා අවශ්‍ය අත්දැකීම් විෂයමාලාව තුළට අන්තර්ග්‍රහණය කිරීම අත්‍යවශ්‍ය වී තිබේ. එම අංශ සාර්ථකව ක්‍රියාත්මක කිරීමට නම් දැනුම මැනීමේ ක්‍රමවේදයෙන් බැහැරව ප්‍රායෝගික අත්දැකීම් හා ආකල්ප මැනිය හැකි ආකාරයේ විභාග ක්‍රමයක් සකස් කර ක්‍රියාත්මක කිරීම ද කාලීන අවශ්‍යතාවක් වේ.

**ගාන්ධි දර්ශනයට අනුව ආගම ඉගෙනීමේ වැදගත්කම**

මිනිසාගේ පූර්ණ වර්ධනයක් ඇති කිරීමට නම් ආධ්‍යාත්මික වර්ධනයක් ඇති කිරීමට අත්‍යවශ්‍ය බව ගාන්ධි පෙන්වා දී ඇත. ඒ සඳහා ආගම ඉගෙනීමේ වැදගත්කම ගාන්ධි මෙසේ පෙන්වා දී ඇත.

''මිනිසෙකුට ආගමක් නොමැතිව ජීවත් වීමට නොහැකිය. එසේ වුවත් සමහරු තමන්ට ආගමක් නැතැයි තර්ක කරයි. එබඳු අය තමන්ට නහයක් නැති වුවත් හුස්ම ගන්නා බව පිළිගන්නා මිනිසකු බඳුය.'' (Gandi, 1959: 8)

ආගම ඉගෙනීම මගින් මිනිසාගේ සදාචාර වටිනාකම් වර්ධනය වන බව ගාන්ධි තවදුරටත් පෙන්වා දී ඇත. සදාචාරය තුළ සත්‍යය, අවිහිංසාව හා සැහීමට පත්වීමේ හැකියාව පවතින බව පෙන්වා දෙන ගාන්ධි අධ්‍යාපනය මගින් එවැනි ගුණාංග වර්ධනය කිරීමේ අවශ්‍යතාව මතු කර දක්වයි. සදාචාරයෙන් තොර ආගම ඉගෙනීම නිෂ්ඵල ක්‍රියාවක් බව එම අදහස් අනුව පැහැදිලි වේ. එපමණක් නොව ගාන්ධි ප්‍රකාශ කරනුයේ තමන් අදහන ආගම පමණක් නොව වෙනත් ආගම් පිළිබඳව ද හැදෑරීම වැදගත් වන බවයි.

''තමන් කුමන ආගමකට අයත් වුවද අනෙක් ආගම් පිළිබඳව අධ්‍යයනය කිරීමෙන් තමාගේ හදවත පුළුල් භාවයට පත්වන බවය.'' (Gandi, 1959: 8)

සියලුම ආගම්වලින් මනුෂ්‍යයා යහමගට ගැනීමට අවශ්‍ය මාර්ගෝපදේශ ලැබෙන බව පෙන්වා දෙන ගාන්ධි අධ්‍යාපන ක්‍රියාවලිය මගින් ආගම් ඉගෙනීමට අවස්ථාව ලබාදිය යුතු බව ප්‍රකාශ කරනු ලබයි.

ශ්‍රී ලංකාවේද බෞද්ධ, හින්දු, ඉස්ලාම්, ක්‍රිස්ත්‍රියානි ආගම් ප්‍රධාන වශයෙන් දක්නට ලැබේ. පාසල් ශිෂ්‍යයන්ට ආගම ඉගෙනීමට වෙන්කර ඇති කාලයෙන් හරි අඩක් තමන් අදහන ආගම ඉගෙනීමටත් ඉතිරි කාලය අනෙක් ආගම් ඉගෙනීමටත් අවස්ථාව සලසා දීම ඉතා වැදගත් වේ. ඒ මගින් අනෙක් ආගම් පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමෙන් ආගමික ගැටුම් ඇතිවීමට ඇති ඉඩකඩ අවම කරගත හැකි

වනු ඇත. එමගින් ශිෂ්‍යයන් තුළ සහයෝගය සහජීවනය වර්ධනය කර ගත හැකි බව මේ අනුව පැහැදිලිය.

**ගාන්ධිගේ අධ්‍යාපන දර්ශනයට අනුව ගුරුභූමිකාව**

ගාන්ධි ඉදිරිපත් කරන ලද අධ්‍යාපන සැලැස්මට අනුව ප්‍රායෝගික අත්දැකීම් ලබාදීම වැදගත් ස්ථානයක තබා ඇත. එහිදී පාසලේ ගුරුවරයාට පුද්ගල අත්දැකීම් මගින් අධ්‍යාපනික වටිනාකමක් ලැබෙන ආකාරයට අධ්‍යාපනය සැලසුම් කිරීමේදී හා සංවිධානය කිරීමේදී විශාල කාර්ය භාරයක් හිමිවන බව ගාන්ධි පෙන්වා දී ඇති බව Patel (1958) පෙන්වා දී තිබේ. ළමයාට අවිහිංසාවාදීව අධ්‍යාපනය ලබාදිය යුතු බව ගාන්ධි පෙන්වා දී ඇති බැවින් ඊට අනුරූපිව ගුරුවරයා ද දයාවෙන් පිරි පුද්ගලයකු විය යුතු වේ. ගුරුවරයාගේ බුද්ධිමය ශක්තිය හා අධ්‍යාත්මික ගුණාංග ශිෂ්‍යයාගේ පෞරුෂය සංවර්ධනයට දායක වන බව පැහැදිලිය. ශ්‍රී ලාංකික ගුරුවරයා ද දැනුම සම්ප්‍රේෂණය කිරීමේ භූමිකාවෙන් මිදී දයාවෙන් යුතුව ශිෂ්‍යයාගේ සාරධර්ම සංවර්ධනයට යොමු වීමෙන් සදාචාරවත් පෞරුෂයක් සහිත පුද්ගලයකු නිර්මාණය කිරීමේ අරමුණින් කටයුතු කළ යුතු බව පෙන්වා දිය හැකිය. ගාන්ධි දර්ශනයට අනුව ගුරුවරයා තුළ තිබිය යුතු ලක්ෂණ කීපයක් Panday (1994) විසින් දක්වා ඇත.

- ඉහළ බුද්ධි මට්ටම
- මනා චිත්තවේග පාලනය
- හොඳ මානසික සංවිධානය
- ඉහළ නිර්මාණාත්මක හැකියාව
- උසස් අභිලාෂයන්
- මනා සිහි කල්පනාවෙන් යුක්ත වීම ආදිය එම ලක්ෂණ වේ.

මේ අනුව බලන විට ගුරුවරයා සාමාන්‍ය පුද්ගලයකුට වඩා සුවිශේෂී ගතිලක්ෂණවලින් සමන්විත යුතුබව පැහැදිලිය. ශ්‍රී

ලාංකික ගුරුවරයා වර්තමානයේ විෂය නිර්දේශ ආවරණය කරන තත්ත්වයට පත්ව ඇත. ඒ වෙනුවට ඉහත ලක්ෂණ ගුරු පෞරුෂය තුළට අන්තර්ග්‍රහණය කරගැනීම කාලීන අවශ්‍යතාවක් ලෙස දැක්විය හැකිය. එවිට ළමයින් තුළ සදාචාරාත්මක අගයන් සංවර්ධනය කර පූර්ණ පෞරුෂයක් සහිත ශිෂ්‍ය ප්‍රජාවක් නිර්මාණය කළ හැකිය. වර්තමානයේ ගුරුවරුන්ගෙන් බහුතරයක් මෙම අංශ පිළිබඳව අඩු අවධානයක් යොමු කිරීම නිසා පාසල් තුළ මත්ද්‍රව්‍ය භාවිතය ඉහළ යාම හා විනය විරෝධි ක්‍රියා වර්ධනය වීම දක්නට ලැබේ. ගුරුවරයාගේ භූමිකා පිළිබඳ අදහස් දක්වන Patel (1958) ගුරුවරයා ගමට, ප්‍රජාවට වැඩ කළයුතු බවත්, ගමට ආලෝකය දෙන්නෙක් විය යුතු බවත් දක්වා ඇත. ඒ මගින් පාසල හා ප්‍රජාව අතර සම්බන්ධීකරණයක් පවත්වා ගත හැකිය. වර්තමානයේ පාසල ගමෙන් හුදකලා වී ඇති ආකාරය නිරීක්ෂණය කළ හැකිය. පොත පතින් දැනුම ලබාදීම අධ්‍යාපනය ලෙස ගාන්ධි නොසැලකීම අනුව විෂය නිර්දේශ සම්පූර්ණ කිරීම ගුරුවරයාගේ ප්‍රධාන භූමිකාව නොවන බව ද පෙන්වා දීමට පුලුවන. ඒ වෙනුවට දැනුම, ආකල්ප හා කුසලතාවලින් පිරි ප්‍රජාවක් බිහිකිරීම අධ්‍යාපනයේ මෙන්ම ගුරුවරයාගේ ද ප්‍රධාන භූමිකාව විය යුතුය. වර්තමාන පාසල්වල සේවය කරන ගුරුවරුන් පාසල අවට ප්‍රජාව සමග ඉතා අවම සම්බන්ධතා පවත්වන බව දක්නට ලැබේ.

මේ අනුව ගාන්ධිගේ අදහස් අනුව ගුරුවරයා පිළිබඳව Chaube (1993) ඉදිරිපත් කර ඇති පහත අදහස ඉතා වැදගත් වේ.

''ගුරුවරයා තම ශිෂ්‍යයන්ට හොඳ දෑ තෝරා බේරා ගැනීමේ දක්ෂතා ඉගැන්විය යුතුය. ගුරුවරයා එසේ ක්‍රියා නොකළහොත් දරුවන්ගේ හැසිරීම් රටාව යාන්ත්‍රික වීම සිදුනොවිය හැකිය. මිනිසා සිතිය හැකි කරුණු දන්නා, සත්ත්වයන් නිසා අපිරිසිදු දේ පිළිබඳ වෙනස පිළිබඳ අවබෝධයක් ලබාගත යුතුය.'' (Chaube, 1993:139)

ඉහත අදහස අනුව ගුරුවරයාට පුලුල් භූමිකාවක් ඉටු කිරීමට සිදුවන බව පැහැදිලිය. ගුරුවරයා ඉහත ගුණාංග තමන් තුළ ආරෝපණය කර ගැනීමෙන් පහසුවෙන් ළමුන් තුළට ද එම ගුණාංග ආරෝපණය කළ හැකිවනු ඇත. ගුරුවරයා සිය ශිෂ්‍යයන්ට ආදර්ශමත් විය යුතු බවද පෙන්වා දී ඇත. ගුරුවරුන් ශිෂ්‍යයන්ට

නියම කරන පොත්පත්වලට සහ ඔවුන් උගන්වන දේශනවලට වඩා ගුරුවරුන්ගේ චර්යාව තුළින් ශිෂ්‍යයන් ඉගෙන ගන්නා බව ගාන්ධි විශේෂයෙන් දක්වා ඇත. ඒ අනුව ගුරුවරයා අනෙකුත් පුද්ගලයන්ට වඩා ආදර්ශමත්ව කටයුතු කිරීමේ අවශ්‍යතාව පැහැදිලි වේ.

ගුරුවරයා විසින් ශිෂ්‍යයන් යම් කිසි වෘත්තියකට ද පුහුණු කිරීමේ අවශ්‍යතාව ගාන්ධි විසින් පෙන්වා දී ඇත. යම් කිසි වෘත්තියක් කේන්ද්‍ර කරගෙන ශිෂ්‍යයන්ගේ චින්තන රටාව, ලිවීම හා කලාත්මක වින්දනය දියුණු කළ යුතු බව ගාන්ධි පවසයි. ගාන්ධිගේ අධ්‍යාපනය හස්ත කර්මාන්ත කෙන්ද්‍රීයව සකස් කර ඇත්තේ එම අරමුණින් වේ. පාසල් හැර යන ශිෂ්‍යයාට තවදුරටත් දෙමාපියන්ට බරක් නොවී තම ජීවනෝපාය මාර්ගයක් සකස් කර ගැනීමට ඉන් අවස්ථාව හිමි වන බව ගාන්ධිගේ අදහස් විය. ශිෂ්‍යයන්ගේ හදවතට සමීප අධ්‍යාපනයක් ලබාදීම ගුරුවරයාගේ භූමිකාව විය යුතුය. ගාන්ධි ගුරුවරයාගෙන් බලාපොරොත්තු වන ප්‍රධාන භූමිකා දෙකකි. එනම් චරිතය ගොඩනැගීම හා ආධ්‍යාත්මික නිදහස (Gandi, 1959) ලබාදීම වේ. මේ අනුව අවසානයේදී ශිෂ්‍යයා ආත්ම සාක්ෂාත්කරණය කරා ළඟාවීමට මග පෙන්වීම අවශ්‍යය.

**සමාලෝචනය**

ගාන්ධි දර්ශනය සුවිශේෂීව අධ්‍යයනය කිරීම මගින් ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයට ද ඒවා ආදේශ කරගත හැකිය. ශිල්ප කේන්ද්‍රීය අධ්‍යාපනයක් හඳුන්වා දීම, මව්බසින් අධ්‍යාපනය ලබන අතර විදේශ භාෂා ඉගෙනීම, චරිත සංවර්ධනය අවිහිංසාව, නිදහස හා ස්වයං විනය ඇතිවීම, යාවජීව අධ්‍යාපනය හා ජාතික ඒකාග්‍රතාව වර්ධනය කිරීම එසේ යොදාගත හැකි අංශ කීපයක් ලෙස පෙන්වාදිය හැකිය. මේ අනුව ශ්‍රී ලංකාව තුළ විභාග කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් ශිෂ්‍යයා මුදවා ගෙන නිර්මාණශීලීත්වය, විචාරශීලීත්වය වැනි විසි එක්වන සියවසට අදාළ කුසලතා වර්ධනය කර ගැනීමට අධ්‍යාපනය මගින් උපකාරී කළ හැකිය. විශේෂයෙන් කෘෂිකාර්මික පසුබිමක් පවතින ශ්‍රී ලංකාවට ගාන්ධි ඉදිරිපත් කරන ලද ශිල්ප කේන්ද්‍රීය අධ්‍යාපනය හරහා හිස, හද හා අත යන ත්‍රිවිධ අංශයම සංවර්ධනය කරමින් පුද්ගලයාටත්, රටටත් ප්‍රයෝජනවත් වන පුරවැසියකු බිහි කිරීමට හැකියාව නිර්මාණය වන බව කිව හැකිය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

කාරියවසම්, සී. (1998). *කාලීන අධ්‍යාපනඥයෝ.* ශික්ෂා මන්දිර ප්‍රකාශන

Bhatia, K. K. (1993). *Principles of Education.* Kalyani Publishers.

Chaube, S. (1993). *Educational Philosophies in India.* Vikas Publishing House.

Dewey, J. (1916). *Democracy and Education*. MacMillan.

Dhiman, O. P. (1987). *Foundation of Education: Philosophy and Sociology of Education*. Atma Ram.

Dale, E. (1969). *Audiovisual Methods in Teaching*. Dryden Press.

Gandhi, M.K. (1938). *Educational reconstruction*. Vora & Co. Publishers

Gandhi, M.K. (1951). *Basic Education*. Navajivan Publishing

Gandhi, M.K. (1959). *Sex Education*. Navajivan Publishing

Gandhi, M.K. (1959). *Preparations for participation*. Navajivan Publishing

Gandhi, M.K. (1959). *The need for charactor*. Navajivan Publishing

Gandhi, M.K. (1966). *Autobiography*. Navajivan Publishing.

Max Wingo, G. (1974). *Philosophies of Education: An introduction*. Sterling Publishers.

Pandey, R.S. (1994). *New Dimentions of Education*. Indian Publishers and Distributors.

Patel, M. S. (1958). *The Educational Philosophy of Mahathma Gandhi*. Navajivan Publishing.

Rousseau, J.J.(1762). *Emil*. Everyman.